**ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමු වන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.2.2 වගුවේ ඇතුලත් ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් විගණනට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටුකිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්මේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 26 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත.එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාර ගණන් දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයන්ට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| <u>මුදල් රෙගුලාසි</u> | | | |
| 128 (1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තු අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කරගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | (i) කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.1.1 |
| | | (ii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |
| | | (iii) අධි ප්‍රතිපාදනය | 2.6 |
| 128 (1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද, සම්පූර්ණයෙන්මද, අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම් වලට බැඳීම සඳහා බලය දීමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ | කළමනාකරණ දුර්වලතා | 2.5 |

| | | | |
|---|---|---|---|
| | අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | | |
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. | 2.9 |
| 128 (1) (ඉ) | රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් බඩු බාහිරාදි උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබාගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යෝක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිශ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128 (1) (ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්යය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව, ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙයින් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණයශේෂ අයකර ගැනීමේ දුර්වලතා | 2.8 |
| 128(1)(ඒ) | දරන ලද කිසියම් වියදමක් හෝ වගකීමක් බැඳීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයක ඇතුළත වැටෙන බව හා එය ප්‍රමාණවත් තරම් අධිකාර බලයෙන් ආවරණය වන බව. | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට බැඳීම. | 2.4 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ජ) | නිලධාරීන්ගේ සේවකයන්ගේ ප්‍රමාදය,නොසැලකිල්ල , වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථා වලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසි නියම කර ඇති කාර්ය පටිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් /සේවකයන් මත අධිභාර පනවනු ලබනු බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | වත්කම් වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම. | 2.3(ආ) |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිළධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා,රජයට ලැබිය යුතුව තිබෙන හිග ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව | හිගහිටි ආදායම් එකතු කිරීමෙන් පසු විපරම් කටයුතු දුර්වල වීම | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

**(අ) අපේක්ෂිත ඉලක්ක සපුරා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූලික ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉඩම් කැබලි 600,000 ක් රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සඳහා සැලසුම්කර තිබුණ ද, එම ඉලක්කය 2017 ඔක්තෝබර් 03 වන දින ඉඩම් කැබලි 300,000ක් ලෙස සංශෝධනය කර තිබුණි. 2016 වර්ෂයේදී රු.19,957,603ක් වියදම් දරා ඉඩම් කැබලි 498,622ක් දත්ත පද්ධතියට ඇතුළත් කර තිබියදී 2017 වර්ෂය තුළ රු.41,157,461 ක පිරිවැයක් දරා ඉඩම් කැබලි 231,021ක් පමණක් දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණි. පූර්ව වර්ෂය සමඟ සැසඳීමේදී වියදම සියයට 106 කින් වර්ධනය වී තිබුණද, දත්ත ඇතුළත් කිරීමේ ප්‍රගතිය සියයට 54කින් පිරිහී තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට වූ රු.23,419,393 ක හිඟ ආදායමෙන් සියයට 75 ක් අයකරගැනීම සඳහා සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.4,696,638 ක් පමණක් අයකරගෙන තිබුණි. එය හිඟ ආදායමින් සියයට 20 ක් වී තිබුණි.

(iii) රජයේ ඉඩම් බදු දීමේ ක්‍රියාවලියට අදාලව බදු නොගෙවන්නන් සම්බන්ධයෙන් නඩු 05 ක් පැවරීම සඳහා සැලසුම්කර ඇතත් බදුකරයක් නිකුත් නොවීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී තිබුණි.

**(ආ) තිරසර සංවර්ධනය**

**---------------------**

තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා පාදක වන දත්ත හඳුනා ගැනීම සහ සන්ධිස්ථානයන් තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබාගැනීම**

**-------------------------------------------------------------**

**2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්මලාන පරිගණක විද්‍යාගාරය සහ ශ්‍රවනාගාරය සඳහා ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට සහ පරිගණක විද්‍යාගාරය සහිත උද්‍යාන පරිශ්‍රය අලංකරණය වෙනුවෙන් එකතුව රු.මිලියන 8.83 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2 මාර්ගෝපදේශය ප්‍රකාර ලංසු කැඳවීමේ ආරාධනයකට ප්‍රතිචාර වශයෙන් ලංසු සූදානම් කිරීමට ලංසු කරුවෙකුට අවශ්‍ය වන සියලු තොරතුරු ලංසු කැඳවීමේ ලේඛනවල අන්තර්ගත විය යුතු වුවත්, එකිනෙක ප්‍රසම්පාදනයන් සඳහා සරිලන පරිදි විස්තරාත්මක තොරතුරු දක්වා නොතිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව උද්‍යාන අලංකරණය කිරීමේ කාර්යය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවද පිළියෙල කර නොතිබුණි.

(ආ) ඔප්පු කවර මුද්‍රණය කිරීම හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වමින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය අනුගමනය කිරීමෙන් තොරව, ඔප්පු කවර 19,000 ක් මුද්‍රණය කිරීම සඳහා 2017 වර්ෂයේ අවස්ථා 05 කදී රු.557,050 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) මොණරාගල සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම සඳහා රු.1,264,188 ක අවම මිල ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරු සමඟ 2016 මැයි 12 දිනදී ගිවිසුමකට එළඹ තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ හා තීරණයන්ගෙන් තොරව අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.3.3 මාර්ගෝපදේශය අනුව ලංසු විවෘත කිරීම සිදුකර නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.291,097 ක් වටිනා වත්කම් තක්සේරු වාර්තාවල ඇතුළත්ව නොතිබුණු අතර 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි.

**(ආ) වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම**

රජයේ ඉඩම් ආඥා පනතේ 91 වගන්තිය හා 2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්පී/02/10 දරන රාජ්‍ය ඉඩම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ඉඩම් පරිපාලනය හා ඉඩම් පරිපාලනය සම්බන්ධ නිලධාරීන් අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ බලතල ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබුණි. එසේ වුවද, බදු මුදල් ක්‍රමවත්ව අයකිරීමේ නිසි ක්‍රමවේදයක් නොතිබුණි. එබැවින් දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉඩම් රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට හා පුද්ගලයන්ට නේවාසික, කෘෂිකාර්මික හා වාණිජ ආදී කටයුතු සඳහා බදු දීමෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා හා පළාත් ඉඩම් කොමසාරිස්වරයා රැස්කරන ආදායමෙහි 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 510.86 ක් හිඟව පැවතුණි.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දෙපාර්තමේන්තුව සතු වාහන 05 ක් වර්ෂයකට අධික කාලයක සිටද, තවත් වාහන 02 ක් වර්ෂ 02 කට අධික කාලයක සිටද, නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ඉ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 7.50 ක් පිරිවැය වූ මෝටර් රථයක් වර්ෂ 02 කට අධික කාලයක සිට ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබාදී තිබුණි.

**(ඊ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් රු.මිලියන 7.12 ක්පිරිවැය වූ වාහනයක් වර්ෂ 03 කට අධික කාලයක සිට ද, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයත් රු.මිලියන 11.40 ක් පිරිවැය වූ වාහන 02 ක් වර්ෂ 09 කට අධික කාලයක සිටද, රු.මිලියන 48.54 ක් පිරිවැය වූ වාහන 07 ක් වර්ෂ 03 කට අධික කාලයක සිටද දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණු නමුත් එම වාහන නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2017 ජුනි 28 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 04 හා 05 ඡේද ප්‍රකාරව සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2016 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 550,875 ක් වූ ස්ථාවර වත්කම් ඉදිරිපත් කළ වාර්තාවට ඇතුලත් කර නොතිබුණි.

(ඖ) 2013 ජූලි 12 දිනැති SA/AS/AA/Circular අංක දරනරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය වත්කම් ලේඛනගත කිරීම සඳහා ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීම 2013 වර්ෂයේදී අවසන් කිරීමට පියවර ගත යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විට එම කටයුතු අවසන් කර නොතිබුණි. ඒ අනුව ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට නොහැකි වී තිබුණි.

## 2.4 බැඳීම් හා බැරකම්

-------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳී සිටිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 4 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.1,251,714 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුලත් නොවූ වැය විෂයයක් වෙනුවෙන් රු.521,407 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට අදාළ පුහුණු වීම් කටයුතු සිදුකිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර අවශ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා රු.මිලියන 17.96 ක් වැය කර තිබුණ ද විදුලි පද්ධතියේ සිදුවූ දෝෂයක් හේතුවෙන් 2017 දෙසැම්බර් වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි. එසේ වුවද, ගොඩනැගිල්ලේ ආරක්ෂාව සහ පවිත්‍රතා කටයුතු වෙනුවෙන් 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 5.44 ක පිරිවැයක්ද දරා තිබුණු අතර එම වර්ෂවලදී නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් මීලෝදා මූලා ආයතනය වෙත රු.මිලියන 3.96 ක් ද ගෙවා තිබුණි.

(ආ) නිරවුල් හිමිකාරත්වයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු ඉඩමක ඉඩම් කොමසාරිස් ජනරාල් නිල නිවස ඉදිකිරීම සඳහා රු.මිලියන 36.40 ක ඇස්තමේන්තුවක් මත 2016 ජනවාරි 12 වන දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර නිල නිවස ඉදිකිරීමෙන් පසු වසරකට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) දීර්ඝකාලීන බදුදීමේ ක්‍රියාවලියෙහි දීර්ඝකාලීන බදු ඔප්පු සඳහා පළාත් ඉඩම් කොමසාරිස් හෝ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලයක් ගතකළ අවස්ථා 05 ක් නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) බදු ඔප්පුවක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත්වල පවතින අඩුපාඩු දැනුම්දීම සඳහා මාස 6 සිට වර්ෂ 05 ක කාලයක් ගතකළ අවස්ථා 08 ක් නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඉ) අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන දීර්ඝකාලීන බදු ලිපිගොනුවල බොහෝ විට අඩුපාඩු පවතින නිසා නැවත හරවා තිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර දීර්ඝකාලීන බදු ඔප්පු ජනාධිපතිතුමාගේ අත්සනට ඉදිරිපත් කිරීමේදී ද අඩුපාඩු සහිතව ඉදිපත් කළ අවස්ථා 03 ක් නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනයකිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 05 ක කාලයක් තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණය පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 206.13 | 203.03 | 3.10 | 1.50 |
| | මූලධන | 51.60 | 50.01 | 1.59 | 3.08 |
| | **එකතුව** | **257.73** | **253.04** | **4.69** | **1.82** |
| 2014 | පුනරාවර්තන | 248.60 | 245.01 | 3.59 | 1.44 |
| | මූලධන | 89.10 | 87.12 | 1.98 | 2.22 |
| | **එකතුව** | **337.70** | **332.13** | **5.57** | **1.65** |
| 2015 | පුනරාවර්ථන | 314.03 | 312.64 | 1.39 | 0.44 |
| | මූලධන | 80.05 | 79.05 | 1.00 | 1.25 |
| | **එකතුව** | **394.08** | **391.69** | **2.39** | **0.61** |
| 2016 | පුනරාවර්තන | 341.46 | 339.57 | 1.89 | 0.55 |
| | මූලධන | 75.36 | 72.66 | 2.70 | 3.58 |
| | **එකතුව** | **416.82** | **412.23** | **4.59** | **1.10** |
| 2017 | පුනරාවර්තන | 350.76 | 342.17 | 8.59 | 2.45 |
| | මූලධන | 54.20 | 34.15 | 20.05 | 36.99 |
| | **එකතුව** | **404.96** | **376.32** | **28.64** | **7.07** |

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.මිලියන 38.70 ක ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 21.87 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය රු.මිලියන 16.83 ක් වූයෙන් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 47 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.7** **ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.02.01.03 සඳහා එකතුව රු.මිලියන 60 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 70.13 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 116.88 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 20 දිනැති අංක 01 /2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 3ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකථනය කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදු කර නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 30.20 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයකට අදාලවිය. හිඟ හිටි ආදායම අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) හිඟ ආදායම් එකතු කිරීමට අදාල පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් පෙර වර්ෂයේ අවසානයට පැවති නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 06 කට අදාල එකතුව රු.මිලියන 10.54 ක හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයනොවී පැවතුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 කට අදාල හිග ආදායම් හා ආදායම් ගිණුමේ ඇතුලත් හිඟ ආදායම් අතර එකතුව රු.මිලියන 2.20 ක වෙනසක් අනාවරණය වී තිබුණත් එම වෙනස්කම් සම්බන්ධයෙන් සැසඳීමක් කර නොතිබුණි.

**2.8** **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 21.00 | 20.35 | 15.20 | 16.36 | 80.00 | 55.45 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.934,016 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ආ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභාවලට මාරු වී ගිය නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂ**

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.105,163 ක ණය ශේෂයක් වසර 26 සිට 29 දක්වා කාල පරාසයක සිටද, පළාත් සභාවලට මාරුවී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු වසර 26 ක් ඉක්මවූ රු.77,360 ක ශේෂයක්ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඇ) අය වැය චක්‍රලේඛ අංක 118 ප්‍රකාරව කටයුතු නොකිරීම**

2004 ඔක්තෝම්බර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.2.1 වගන්තිය ප්‍රකාරව පළාත් සභාවලට මුදාහල නිලධාරීන්ගේ ණය ශේෂ පළාත් සභාවෙන් එකවර අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. 3.2.2 වගන්තිය ප්‍රකාරව එසේ කළ නොහැකි නම් අදාල පළාත් සභාවෙන් මාසිකව ණය වාරිකය හා පොළිය ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ වුවද, පළාත් සභා 03 කින් අයවිය යුතු වසර 07 ක් ඉක්ම වූ එකතුව රු.210,367 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව අයකර නොතිබුණි.

## 2.9 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 70.86 ක් විය. ඒ තුළ පවතින වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 66.57 ක් වූ තැන්පතු 31 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 276.21 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.490,610 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 43 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 10 | 28 |
| (iii) | ද්විතියික මට්ටම | 674 | 399 | 275 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 140 | 111 | 29 |
| | **එකතුව** | **905** | **563** | **342** |